# කොළඹ අවට පැරණි විහාරයන්හි
# දහ නව වන සියවසට අයත් බිතු සිතුවම්

කැලණි රජ මහා විහාරය, කරගම්පිටිය සුබෝධාරාමය, කෝට්ටේ ජයවර්ධනාරාමය හා සපුගස්කන්ද ශ්‍රී මහා විහාරය යන විහාරස්ථානයන්හි බිතු සිතුවම් ආශ්‍රයෙන් කරන ලද අධ්‍යයනයකි.

මංගලිකා ජයතුංග

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 89 |
| වර්ග අංකය | |

ශාස්ත්‍රපති උපාධි අවශ්‍යතාවන්ගෙන් කොටසක් සම්පූර්ණ කිරීම සඳහා කැලණි විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨය වෙත ඉදිරිපත් කෙරෙන ශාස්ත්‍රීය නිබන්ධය.

1986 ඔක්තෝබර්

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

## සා රා ං ශ ය

ප්‍රාග් ඓතිහාසික සමයෙහි සිට දහ නව වන සියවස දක්වා ශ්‍රී ලංකාවේ සිතුවම් කලාව ඓතිහාසික ව පරිණාමයට පත් වූ ආකාරය පිළිබඳ සංක්ෂිප්ත සටහනක් මෙම නිබන්ධයේ පළමු වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. කලා ඉතිහාසඥයන් හා පුරා විද්‍යාඥයන් ද ඇතුළු විද්වතුන් විසින් ශ්‍රී ලංකාවේ සිතුවම් කලාව අළලා රචනා කොට ඇති පොත් පත් හා ලිපි ලේඛන මෙම අධ්‍යයනය සඳහා බෙහෙවින් උපයෝගී කොට ගත්තෙමි. සිතුවම්වල විෂය හා ශෛලිය පිළිබඳව ත්, කාල නිර්ණය පිළිබඳව ත්, ඔවුන් විසින් ඉදිරිපත් කොට ඇති මතවාද විමර්ශනයට ලක් කළ අතර, හැකි අවස්ථාවල දී ඒ පිළිබඳ ස්වාධීන මතවාද ඉදිරිපත් කිරීමට ද උත්සාහ ගත්තෙමි.

කොළඹ නගරය අවට පිහිටි පැරණි බෞද්ධ සිද්ධස්ථාන හතරක් ආශ්‍රයෙන් දහ නව වන සියවසට අයත් බිතු සිතුවම් පිළිබඳ අධ්‍යයනයක් දෙ වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. කැලණි රජ මහා විහාරය, දෙහිවල කරගම්පිටිය සුබෝධාරාමය, කෝට්ටේ ජයවර්ධනාරාමය හා සපුගස්කන්ද ශ්‍රී මහා විහාරය මෙම අධ්‍යයනයට ප්‍රස්තුත වූ විහාරස්ථාන හතරයි. මෙම විහාරස්ථානයන් හි ඓතිහාසික පසුබිම අවබෝධ කර ගැනීම පිණිස මූලාශ්‍ර කෘතිවලට අමතරව විහාරාධිපති හිමිවරුන් සතුව පවත්නා පැරණි ලිපි ලේඛනවල ආධාරය ද ලබා ගත්තෙමි. බිතු සිතුවම්වල පිරි සැලසුම් හා අන්තර්ගතය පිළිබඳව ද දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට තිබේ.

පූර්වෝක්ත විහාරස්ථානයන් හි බිතු සිතුවම් සඳහා මෙවැනි අන්තර්ගතයක් තෝරා ගැනීමට තුඩු දුන් සමාජ සාධක පිළිබඳ විග්‍රහයක් ද බිතු සිතුවම්වල අන්තර්ගතය හා මූලාශ්‍ර කෘති හා අතර දිස්වන අනුකූලත්වය පිළිබඳ විග්‍රහයක් ද තුන් වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. මෙය මෙම විහාරස්ථාන හතරෙහි බිතු සිතුවම් පිළිබඳ යාථාර්ථ්‍යාත්මක විග්‍රහයක් වන අතර, අවශ්‍ය අවස්ථාවල දහ අට වන සියවසට අයත් කන්ද උඩරට විහාරයන් හි බිතු සිතුවම් පිළිබඳව ද අවධානය යොමු කොට තිබේ.

දහ නව වන සියවසට අයත් බිතු සිතුවම් සම්ප්‍රදාය සඳහා නිශ්චිත වූ ශෛලියක් හා ශිල්ප ධර්ම පද්ධතියක් නිර්ණය කර ගනු ලැබීමට හේතු සාධක වූ කරුණු පිළිබඳ විග්‍රහයක් සිව් වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ. උක්ත විහාරස්ථාන හතරෙහි බිතු සිතුවම්වල මූලික ශිල්පීය හා සෞන්දර්යාත්මක මූල ධර්ම පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් ද මේ මගින් ඉදිරිපත් කෙරේ. මෙම විග්‍රහයේ දී ලක්දිව පැරණි බිතු සිතුවම් සම්ප්‍රදාය පිළිබඳව ද, දහ අට වන සියවසට අයත් කන්ද උඩරට ප්‍රදේශවල බිතු සිතුවම් සම්ප්‍රදාය හා ප්‍රාදේශීය ශෛලීන් පිළිබඳව ද අවධානය යොමු කොට තිබේ.

මෙතෙක් සාකච්ඡා කළ කරුණු අනුසාරයෙන් පූර්වෝක්ත විහාරස්ථාන හතරෙහි බිතු සිතුවම් පිළිබඳ අනුමාන කාල නිර්ණයක් අවසාන වශයෙන් ඉදිරිපත් කෙරේ. මෙම නිබන්ධය සිතියම් හා සැලසුම් අටකින් ද, රේඛා චිත්‍ර හා ඡායාරූප එකසිය හතලිස් හතරකින් ද තෝරාගත් ආශ්‍රිත ග්‍රන්ථ ලේඛනයකින් ද සමන්විත වේ.

## Abstract

The first chapter of the dissertation gives a brief outline of the painting traditions of Sri Lanka from prehistoric times to the nineteenth century. It is based on the works of the art historians, archaeologists and other scholars in the field of Sri Lankan painting. Having taken into account the interpretations of such scholars, the subject, style and chronology of these paintings, I have attempted to draw independent conclusions wherever possible.

A study of nineteenth century painting, based on the temple paintings found in four ancient Buddhist temples in the vicinity of Colombo, is presented in the second chapter. The temples examined are the Raja Mahā Vihāraya in Kelaniya, the Subōdhārāmaya in Karagampitiya ( Dehiwala ), the Jayawardhanārāmaya in Kotte and Sri Mahā Vihāraya in Sapugaskanda. The historical background of these four temples is gathered from historical texts and documentary evidence found in the possession of the incumbent priests. The layout of the murals in each of these temples has been discussed in detail. The subsequent chapter (chapter 3) contains an analysis of the social factors which seem to have determined the selection of the subject matter of the paintings in these temples. It also contains an analysis of the compatibility as well as the points of differentiation

between the content of the murals and description of the narratives found in the literary sources. While the study is mainly confined to a comparative analysis of the murals of the four temples which form the main selection of this dessertation, attention is also directed at similar material in the eigteenth century murals of the Kandyan region.

The fourth chapter is devoted to an analysis of the factors that helped to decide the style and techniques of the painting traditions of the nineteenth century. Apart from this, the basic technical and aesthetic principles found in this mural tradition are also discussed in detail. In the course of this analysis attention is again drawn to the traditions of eighteenth century Kandyan murals and also to provincial styles. In the light of the factors discussed above, it has been possible to offer in the concluding chapter an approximate dating of the paintings in the four temples.

The dissertation contains thirty three maps, plans and line drawings, and one hundred and forty seven photographs and has a select bibliography.